MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

SINHALA

සිංහල

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## සිංහල භාෂාව හා සාහිත්‍ය - I

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** | **කාලය - පැය 1 යි**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. ඔබට සපයන බහුවරණ කඩදාසිය ප්‍රයෝජනයට ගන්න.
- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. ඔහු මිතුරන් සමඟ තිබූ <u>පයුරුපාසානය නිසා</u> ඔහුගේ ජීවිතය නව මඟකට හැරිණි.

I. අමනාප වීම

II. ඉතා ළඟින් ඇසුරු කිරීම

III. හිතවත් වීම

IV. අදහස් හුවමාරු වීම

02 . <u>කැලෑ නීතිය</u> රජවීම බොහෝ ව්‍යවසනයන්ට හේතු විය.

I. සතුරු කරදර ඇතිවීම

II. වනසතුන් නිසා ඇතිවන කරදර

III. කැලෑ කපන්නන්ගේ නීතිය

IV. බලවතා දුබලයා පෙළීම

03. නංගී දිළිඳුකම ගැන <u>අබ මල් රේණුවක්වත්</u> නොසිතා ඉගෙනීමේ වැඩ කටයුතු කළා ය.

I. කිසිවක් නොසිතා

II. සියල්ල අතහැර දමා

III. අංශු මාත්‍රයකුදු නොසිතා

IV. ඉතා උනන්දුවෙන්

- **අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. වෛද්‍යවරයාගේ සියලු ප්‍රයත්න ............................ කරමින් ඇයගේ රෝගය උත්සන්න විය.

I. වියුක්ත | II. විෂධ

III. ව්‍යවර්ථ | IV. නිශේධනය

The National e-learning Portal for The General Education

05. විදග්ධ කවීන්ගේ කාව්‍ය නිර්මාණ තුළ ඔහුගේ ...................................... කැපී පෙනේ.

I. සතතාභ්‍යාස

II. ව්‍යුත්පත්තිය

III. ප්‍රහර්ෂණීය

IV. අනභිභවනීය

06. ............................ මානවයා සන්නිවේදන ක්‍රියාවලියේ හිනිපෙත්තට ම ගමන් කර ඇති බව පෙනේ.

I. පරිණත

II. නූතන

III. අපරදිග

IV. පෙරදිග

07. අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

I. කෛලාස , නෛපුණ්‍ය , මෛත්‍රිය , වෛද්‍ය

II. දේශනය , පෞද්ගලික , ගෞරවය , තෝමර

III. භෞමික , කෞෂික , ගෞරවය , බෞද්ධ

IV. ප්‍රතිග්‍රහණ , ක්‍රමය , ප්‍රේක්ෂක , බ්‍රහ්ම

08. සැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

I. විශ්මය , පුස්තකාලය , විශ්වාශය , ප්‍රදර්ශනය

II. අබිනන්දන , නිශ්ක්‍රිය , දීර්ග , ගගනගාමී

III. සමස්ත , ශිෂ්ටාචාරය , කනිෂ්ඨ , ගවේෂණය

IV. විශ්ලේසණය , අතීරනය , දිලිඳු , නිලඹර

09. රේපය , රකාරාංශය , ගයනුකිත්ත , දීර්ඝ පාපිල්ල පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරන්න.

I. ධර්‍මය , දුම්රිය , ගෞරවය , පැන

II. කර්‍මය , කුරුණෑගල , කෞමුද , කෑරගල

III. චර්‍මය , ප්‍රවාහනය , ගෞතම , නෑගම

IV. වර්‍ණය , ප්‍රතිග්‍රහණය , මෞර්ය , රූපය



The national e-learning Portal for The General Education

10. අක්ෂර වර්ගීකරණය අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

I. ඥ , ඞ , ඳ , ජ , ෆ

II. ස , ෂ , හ , ල , ෆ

III. ප , එ , බ , හ , ම

IV. ට , ඨ , ඩ , ඪ , න

11. උපසර්ග පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

I. කොයිබ , ප්‍රතිමල්ලව , පවර , පවස

II. ඔබ , කැඩුණු , නැටිලි , කෙරුමන්

III. මෙන් , උපදෙස් , පිළිතුරු , පිරිසිදු

IV. අවසඳ , අනුබල , නිකසල , පිරිසිදු

12. පූර්වස්වරලෝප , ගාත්‍රාක්ෂරලෝප , ස්වරාදේශ , ගාත්‍රාදේශ යන සන්ධි සඳහා ගැළපෙන පිළිතුර වන්නේ,

I. තරිඳු , ගංතෙර , දැල , පන්සාලිස්

II. ළිංමැඩි , සුරිඳු , ගිනියම් , ගුරුතුමා

III. හිතැති , නිලඹර , දියති , ඔවුනොවුන්

IV. දඩයම් , වටොර , ඇද්දල , සිපියෙව්

The National e-learning Portal for The General Education

13. නිවැරදි විසන්ධිය තෝරන්න.

I. අත්‍ය + උත්තම

II. නිල + අඹර

III. මහ + ඊශ්වර

IV. ලග් + ගල

14. **' බලයි'** යන ක්‍රියා පදයේ ක්‍රියා ප්‍රකෘතියත් **' වඳුරා '** යන නාම පදයේ නාම ප්‍රකෘතියත් දැක්වෙන වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

I. බලා , වඳුරු

II. බලන් , වඳුරු

III. බල , වඳු

IV. බල , වඳුරු

15. මව ළිඳෙන් වතුර අදියි.

කුරුල්ලා අත්තෙහි හිඳියි.

ඇය පෑනෙන් ලිවුවා ය.

ළමයි පාසල් යති.

ඉහත වාක්‍යයන්හි ඉරි ඇඳි පද අයත් විභක්ති අනුපිළිවෙළින් දැක්වෙන්නේ

I. ප්‍රථමා , කර්ම , කර්තෘ , අවධි

II. අවධි , ආධාර , කරණ , ප්‍රථමා

III. අවධි , ආධාර , කරණ , ආලපන

IV. ආධාර ,අවධි , කරණ , ආලපන

16. පහත සඳහන් ක්‍රියා පද අතරින් නොගැළපෙන වරණය තෝරන්න.

I. බලවයි , ගන්වයි , කඩවයි , දුවවයි

II. කරත , බලත , කියත , වස්වත

III. නටමින් , බලමින් , අඬමින් , දුව දුවා

IV. කරනු , බලව් , ගනු , පැළඳ

17. A - සුරත් තඹරු පෙති සෙ නෙතින්

B - වත සුපිපි පියුමකි.

C - නිදහස මහ මුහුදක් වේ.

D - දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට

උපමා ඇතුළත් කවි පද නිවැරදිව දැක්වෙන්නේ,

I. A හා D

II. A හා B

III. B හා C

IV. C හා D

18. නිවැරදි තද්ධිත පද ඇතුළත් වරණය තෝරන්න.

I. වරලස , මුහුලස් , කොපුලත් , නළලත්

II. වරලස් , මුහුලස , කොපුලත් , නළලත්

III. වරලස් , මුහුලස් , කොපුලත , නළලත්

IV. වරලස් , මුහුලස් , කොපුලත් , නළලත්

The National e-learning Portal for The General Education

19. අතීත කෘදන්ත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

I. නටන , ගයන , වයන , මරණ

II. ලියවිලි , කියමන් , කෙරුමන් , කැපිලි

III. නැටු , මැරූ , කෙටු , බැලූ

IV. මැරිණි , නටන , ගැයිණ , බැලිණ

20. සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

I. චිරන්තන - පුරාණ , ප්‍රභාව - ආලෝකය , ශෛල - පාෂාණ , සූර්යයා - දිනකර

II. සැකය - විචිකිච්ඡාව , පංකජ - නෙළුම , ඇතා - කිණෙර , දෘෂ්ටිය - දැක්ම

III. තරිඳු - සඳ , නුවණ - ඥානය , අක්ෂිය - ඇස , තුරු - තරු

IV. ශ්වේත - සුදු , නර - මිනිස් , ගගන - අහස , ප්‍රාර්ථනය - පැතුම

21. විරුද්ධාර්ථ පද යුගලයක් ඇතුලත් නොවන පිළිතුර තෝරන්න.

I. කුටිල - අවංක

II. උද්‍යෝගී - කම්මැලි

III. දිනමිණ - දිනකර

IV. අඹ - අග්නිය

22. **'උසුලයි'** යන පදයෙහි ස්වර හා ව්‍යංජන වෙන්කළ පසු ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

I. උ + සු + ල + අ + ය් + ඉ

II. උ + ස් +උ + ල් + අ +ය් +ඉ

III. උ + ස් + උ + ල +අ + ය් + ඉ

IV. උ + ස් + උ + ල + යි

- **අංක 23 හා 24 දක්වා යන ප්‍රශ්නවල වාක්‍ය අතරින් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.**

23. I. මල්ලී සමඟ නුඹ ගමට යති.

II. ගෙවිලියන් ගොයම් කපද්දී ළමයි බලා සිටියි.

III. අයියා ද මම ද තෝ ද පාසලට යමු.

IV. සියලු වන සතුන් නියඟයට ගොදුරු වූහ.

24. I. කම්කරුවන් හෙට දින සේවයට පැමිණේ වි.

II. ගොවීහු රැස්වීමට පැමිණ නැත.

III. ගුරුවරුන් සමඟ සිසුන් චාරිකාව සංවිධානය කළහ.

IV. ඇතමෙක් නටද්දී සමහරෙක් ගී ගැයූහ.

25. **පහසු අවස්ථාවක් පෙනෙන්නට තිබිය දී අපහසු කාර්යයකින් ක්‍රියාත්මක වීම ,** අදහස් වන පිරුළ තෝරන්න.

I. වක්කඩේ හකුරු හැංගුවා වගෙයි.

II. බොරදියේ මාළු බාන්න වගෙයි.

III. තරාදිය තියෙද්දි අතින් කිරන්න වගෙයි.

IV. පහන් කන්ද මුල අඳුර වගෙයි.

26.“අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ.”

මෙම කවි පදයෙහි අර්ථය දැක්වෙන පිළිතුර තෝරන්න.

I. පැරණි භෝජන ක්‍රමයකි.

II. සතුරන් මිතුරු කරගැනීමේ ක්‍රමයකි.

III. අස්වැන්න ගෙදරට රැගෙන ඒමේ චාරිත්‍රයකි.

IV. පැරන්නන් ආගන්තුක සත්කාරයේ දී ඉන් වැලකී සිටීමට යොදන පිළිවෙතකි.

27. “ගෙයක් කන ම සැදැහෙන් දෙවන දකුණුය.”

I. නගරයේ දකුණු දිශාවේ නිවෙස් පිහිටා ඇති බව

II. ගෙයක් ගෙයක් පාසා ශ්‍රද්ධාවෙන් දානය දෙන බව

III. දානයක් පිළියෙළ කරගන්නා ආකාරය

IV. ශ්‍රද්ධාව දානයට හේතුවක් බව

28. “ කාලගුණ විද්‍යාඥයෝ මිනිසුන් දැනුවත් කළහ” යන වාක්‍ය කර්මකාරකයට හැර වූ විට නිවැරදි පිළිතුර වන්නේ

I. කාලගුණ විද්‍යාඥයන් විසින් මිනිස්සු දැනුවත් කරනු ලැබිය.

II. කාලගුණ විද්‍යාඥයන් විසින් මිනිස්සු දැනුවත් කරති.

III. කාලගුණ විද්‍යාඥයන් විසින් මිනිස්සු දැනුවත් කරනු ලැබූහ.

IV. කාලගුණ විද්‍යාඥයන් විසින් මිනිස්සු දැනුවත් කරනු ලැබුවේ ය.

29. පහත දැක්වෙන තත්සම තත්භව පද යුගල අතර වැරදි පද යුගලය තෝරන්න.

I. මල් දම් - පුෂ්ප දාම

II. සුවඳ දුම් - සුගධ ධූප

III. ගිම් - ග්‍රීෂ්ම

IV. මනාසේ පිපුණු - සුපුල්

30. පහත දැක්වෙන වරණ අතුරින් උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

I. ඇතෙකු , ළමයෙකු , ගවයෝ , කාන්තාවක

II. ගැහැනියක් , මිනිසෙක් , ළමයෙක් , මවක්

III. ශිෂ්‍යාවක් , තාරාවෙක් , කොටියෙකු , හිවලෙකු

IV. බමුණෙකු , මලක් , රජකෙනෙකු , කම්කරුවෙකු

31. 1 - කුකවි A - විභක්ති සමාසය

2 - සිහවගවලස් B - අන්‍යාර්ථ සමාසය

3 - කිරිබත් C - අව්‍ය සමාසය

4 - මිණිමුතු D - ද්කාරාර්ථ සමාසය

1 , 2 , 3 , 4 පද ගැළපෙන සමාසය ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ

I. D , C , A , B

II. C , D , A , B

III. C , A , D , B

IV. A , B , C , D

32. ‘ළමයි තරඟ වදියි’ යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට නිවැරදි වන්නේ

I. ළමයින් තරඟ වදියි.

II. ළමයින් තරඟ වැදෙති.

III. ළමෝ තරඟ වදියි.

IV. ළමයි තරඟ වදිති.

33. "මිහිඳා නිතිනා සොඳිනා පෙනෙන විලසා" මෙහි සඳහන් කාව්‍යාලංකාරය වන්නේ,

I. උපමා හා රූපක

II. අනුප්‍රාසය හා රූපක

III. අනුප්‍රාසය හා උපමා

IV. ව්‍යංග්‍යාර්ථය හා රූපක

34. පහත දැක්වෙන වාක්‍යයේ ඉරි ඇඳි පද ඇතුළත් වියරණ අංගය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

<u>නැටුම්</u> <u>බලා</u> අයියාත් <u>සමඟ</u> මල්ලී ගෙදර <u>ගියේ ය.</u>

I. පූර්ව ක්‍රියා , කෘදන්ත ,නිපාත , අවසාන ක්‍රියා

II. අවසාන ක්‍රියා , පූර්ව ක්‍රියා , කෘදන්ත , නිපාත

III. කෘදන්ත , පූර්ව ක්‍රියා , නිපාත , අවසාන ක්‍රියා

IV. නිපාත , කෘදන්ත , පූර්ව ක්‍රියා , අවසාන ක්‍රියා

35. බුදුගුණ අලංකාරය , ලෝවැඩ සඟරාව , හංස සන්දේශය යන කෘතිවල රචකයා වන්නේ,

I. වීදාගම මෛත්‍රී හිමියන්

II. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්

III. ධර්ම කීර්ති හිමියන්

IV. 2වන පණ්ඩිත පරාක්‍රමබාහු රජු

36. පහත කවි පදය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද පේළිය තෝරන්න.

වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන
..........................................................................
බල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන

I. වෙල ලස ගැවසි සක් මුතු පබළු බබළන

II. සක් මුතු පබළු වෙල ලස ගැවසි බබළන

III. මුතු සක් පබළු වෙල ලස ගැවසි බබළන

IV. වෙල ලස ගැවසි මුතු සක් පබළු බබළන

e-තක්සලාව The National e-learning Portal for The General Education

- **37 ,38 ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

37. ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය සඳහා වැව් අමුණු තැනවීමට පැරණි රජවරුන්ගේ අවධානය යොමු වී තිබුණි.

 I. පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්වයංපෝෂිත විය.

 II. ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් පිළිබඳව පැරණි රජවරු සැළකිලිමත් වූහ.

 III. වැව් අමුණු තැනවීමෙන් ස්වයංපෝෂිත ආර්ථිකයකට පදනම වැටිණි.

 IV. පූරාණ රජවරුන්ගේ වාරි තාක්ෂණය නිසා පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්වයංපෝෂිත විය.

38. ස්වාභාවික සංසිද්ධියක් වන අකුණු සැර ශ්‍රී ලංකාවේ බහුල උපද්‍රවයක් මෙන් ම අපදාවක් ලෙස ද හඳුනාගෙන ඇත.

 I. අකුණු සැර ස්වාභාවික උපද්‍රවයකි.

 II. අකුණු සැර ආපදාවක් වේ.

 III. ස්වාභාවික සංසිද්ධියක් නිසා ඇතිවන අකුණු සැර ආපදාවක් මෙන් ම උපද්‍රවයකි.

 IV. ශ්‍රී ලංකාවේ ආපදා අතර අකුණු සැර බහුලව පවතී.

39. විරාම ලකුණු නිවැරදිව යෙදී ඇති වාක්‍යය තෝරන්න.

 I. " ඕවා කන්ඩ පුළුවන් දේවල් ද?" යි අම්මා ඇසුවා ය.

 II. " ඉරක් හඳක් තරුවක් ඉල්ලා නොහඬම්"

 III. 4 : 3 අනුපාතයට ගන්න

 IV. අභය වැව වාපී සංස්කෘතියේ මුල් ම සලකුණකි.

40. 'සුපුල් මල් යහන් ලිය මැඩි ලිය ගෙ පෙළ ' යන්නෙහි අර්ථය වඩාත් නිවැරදි ව දැක්වෙනුයේ,

 I. හොඳින් මල් පිපී ඇති පරිසරයක් ඇති බව

 II. නිවෙස්වල මල් සිටුවා ඇති බව

 III. පිපිණා වූ මල් යහන් ලතා මණ්ඩපය හා ලතා ගෘහයන්ගෙන් ගැවසී ගත් බව

 IV. පිපුණා වූ මල් යහන් සහිත ගෘහ පෙළක් තිබූ බව

The National e-Learning Portal for The General Education

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

SINHALA

සිංහල

# MARKING SCHEME - I,II,III

# පිළිතුරු පත්‍රය - I,II,III



අනුග්‍රහය :

**සිංහල භාෂාව හා සාහිත්‍ය I පත්‍රය**

**පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| (1). 2 | (11). 4 | (21). 3 | (31). 2 |
| (2). 4 | (12). 1 | (22). 2 | (32). 4 |
| (3). 3 | (13). 3 | (23). 3 | (33). 3 |
| (4). 3 | (14). 4 | (24). 1 | (34). 3 |
| (5). 2 | (15). 2 | (25). 3 | (35). 1 |
| (6). 2 | (16). 4 | (26). 4 | (36). 4 |
| (7). 1 | (17). 1 | (27). 2 | (37). 4 |
| (8). 3 | (18). 4 | (28). 3 | (38). 3 |
| (9). 4 | (19). 3 | (29). 4 | (39). 2 |
| (10). 3 | (20). 2 | (30). 3 | (40). 3 |

The National e-learning Portal for The General Education

**සිංහල භාෂාව හා සාහිත්‍ය II පත්‍රය**

**පිළිතුරු**

(I) (අ) ප , ඵ , බ ,භ , ම , උ , ඌ

(ආ) ඉ , ඊ , ච , ඡ , ජ , ඣ , ඤ ,ය , ශ

(II) (අ) ප්‍රාසංගික

(ආ) කනගාටුවකි

(III) (අ) අද , ඊයේ , හෙට , ඉක්බිති , අනතුරුව

(ආ) විසම , පිළිගන්නට

(IV) උපමාව - නෙත් අඹ වගෙයි / තුඩු දොඩම් කටු මෙනි.

රූපකය - පා පොල් කෙඳි තොටිල්ලෙකි

(V) (අ) ගොවිණය - විභක්ති සමාසය

(ආ) පංචශීලය - විශේෂණ සමාසය

(VI) (අ) හොටි අම්මා - ආච්චි (මහලු කත)

(ආ) බෝල්ලු - මී හරක්

(VII) (අ) ගුරුවරුන්

(ආ) මිතුරෝ

(VIII) දුරකථනයෙන් - කරණ විභක්තිය

මල්ලීට - සම්ප්‍රදාන විභක්තිය

(IX) (අ) බුදු රශ්මිය - බුදු රැස් / බුද්ධරශ්මිය

(ආ) සරු භූමියක් - සාර භූමියක් / සරු බිමක්

(X) (අ) කැටතෙල - කැඩපත

(ආ) කදෝපැණියක් - කනාමැදිරියන් / කලා මැදිරියන්

The National e-learning Portal for The General Education

02. (I) සාරවත්භාවය ,මාතෘකාව ද ඇතුළුව (ලකුණු 08)

(II) සංවිධානය , නිර්මාණාත්මක බව හා ස්වීයත්වය (ලකුණු 12)

(III) ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම (ලකුණු 05)

(I) සාරවත්භාවය - ලකුණු 07

මාතෘකාව - ලකුණු 01

(තේමාවට අදාළ බව , ඉදිරිපත් කර ඇති ව්‍යුහයට සමාන බව , සරු බව හා සම බව , වචන ගණන 250ට සමීපව පැවතීම යන කරුණු මේ යටතේ සැලකිල්ලට ගත යුතු ය)

(II) සංවිධානය , නිර්මාණාත්මක බව හා ස්වීයත්වය (ලකුණු 12)

(මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය , සංවිධානය , ස්වීයත්වය , නිර්මාණාත්මක ප්‍රකාශන ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ සලකා බැලිය යුතුය.)

(III) ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම (ලකුණු 05)

(වියරණ ,අත් අකුරු , විරාම ලක්ෂණ භාවිතය , ඡේද අදාළ පරිදි වෙන් කොට තැබීම , පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතුය.)

* **සැලකිය යුතුයි ..................**

රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩුවන විට ඉහත දැක්වෙන **I , II , III** යන කොටස්වලට අනුපාතිකව ලකුණු තීරණය කළ යුතුය.

(ලකුණු 25 යි)

03. සාරාංශ වීමේ දී පහත සඳහන් කරුණු ප්‍රධාන කරුණු ලෙස ඉස්මතු වී තිබිය යුතුය.

* සරල සමාජයේ සංස්කෘතිය පවරා දීමේ කාර්යය පවුල මගින් සිදු කළ බව
* නමුත් සමාජය සංකීර්ණ වීමත් සමඟ ඒ කාර්යය පාසල වෙත යොමු වූ බව
* ජාතික හා විශ්ව සංස්කෘතිය පවරා දීමේ පුළුල් කාර්යය ද පාසල වෙත පැවරී ඇති බව
* ශාස්ත්‍රීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සම්ප්‍රදාය ඇසුරින් ගොඩනගා ගත් අධ්‍යාපන ක්‍රියාවලියක් තුළින් පාසල් සංස්කෘතිය ක්‍රියාත්මක වන බව
* පාසල් සංස්කෘතිය නෛතික බැඳීම්වලින් තොර විය යුතු බව
* සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පාසල් සංස්කෘතිය අදෘෂ්‍යමාන බලවේගයක් ලෙස ක්‍රියා කරන බව

(ලකුණු 10 යි)

04. (I) ජෝන්ස් ඇඩම්ස්.

(II) උගන්වනු ලබන විෂය, ඉගෙන ගනු ලබන ළමයා

(III) උදාසීන බව, චර්යාමය ගැටලු, මතක තබා ගැනීමේ අපහසුතා, තේරුම් ගැනීමේ අපහසුතා , තේරුම් ගැනීමේ අපහසුතා, ඉන්ද්‍රීය ආබාධ, චිත්තවේගී ගැටලු

(IV) මැදිහත් සිතින් කටයුතු කිරීම, උපේක්ෂාවෙන් කටයුතු කිරීම, ඉවසීමෙන් කටයුතු කිරීම, උනන්දුවෙන් කටයුතු කිරීම.

(V) (අ) ශාක්‍යතාව - හැකියාව

(ආ) උදාසීන - කැම්මැලි, අලස

(ලකුණු 2 X 5 = 10 )

05. වාපාරික ලිපිය.

(I) ආකෘතිය (ලකුණු 05)

(II) අන්තර්ගතය (ලකුණු 07)

(III) ශිල්පීය දක්ෂතා (ලකුණු 03)

(I) **ආකෘතිය** (ලකුණු 05)

(I) යවන්නාගේ ලිපිනය හා දිනය (ලකුණු 01)

(II) ලබන්නාගේ තනතුර හා ලිපිනය (ලකුණු 01)

(III) ආමන්ත්‍රණය (ලකුණු 01)

(IV) මාතෘකාව (ලකුණු 01)

(V) නිවැරදි නිමාව (ලකුණු 01)

(II) **අන්තර්ගතය** (ලකුණු 07)

(III) **ශිල්පීය දක්ෂතා** (ලකුණු 03)

(අක්ෂර වින්‍යාසය , වියරණ ,විරාම ලකුණු පැහැදිලි අත් අකුරු උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය , සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.)

* නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන විට අනුපාතික ලකුණක් පිරිනමන්න.
* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති විට අන්තර්ගතය සඳහා දිය හැකි උපරිම ලකුණු 03 කි.

<u>පුවත් පත් වාර්තාව</u>

(I) ආකෘතිය (ලකුණු 05)

(II) අන්තර්ගතය (ලකුණු 07)

(III) ශිල්පීය දක්ෂතා (ලකුණු 03)

(I) **ආකෘතිය** (ලකුණු 05)

- ආකර්ෂණීය මාතෘකාව (ලකුණු 01)
- වාර්තාකරු දැක්වීම (ලකුණු 01)
- කරුණු ප්‍රමුඛත්වය අනුව පෙළගස්වා තිබීම (ලකුණු 03)

(II) **අන්තර්ගතය** (ලකුණු 07)

(III) **ශිල්පීය දක්ෂතා** (ලකුණු 03)

The National e-learning Portal for The General Education

**සිංහල භාෂාව හා සාහිත්‍ය III පත්‍රය**

**පිළිතුරු**

01. (I). (අ) බුදුන් වහන්සේ

(ආ) 18 යි

(II). (අ) කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු

තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

(ආ) ඇඹිල්ලේ තරමට ඉදිමෙන්න ඕන ලූ

(III). (අ) සිංහබාහු සහ සිංහ සීවලි යන දෙදෙනාගේ

(ආ) රමෝන් , මැග්සෙසයි , ස්වර්ණ රජත , කුමාරන් අශාන්

(IV). (අ) බල - බලය

(ආ) බල - බලන්න

(V). (අ) අනුප්‍රාසය

(ආ) මුඪගර්ග - ගැබ් මුළා වූ

පණිවා - ප්‍රාණඝාතය

(VI). (අ) සියබස්ලකර

(ආ) සිව්වන සේන රජු

(VII). (අ) රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය

මිහිරි මවු කිරි වගේ පොවන්නෙමි නුඹලාට

(ආ) මිහිරි මවුකිරි වගේ

(VIII). (අ) චූලනි බ්‍රහ්මදත්ත රජු

(ආ) දර ගෙන්වීම නැවැත්වීම

(IX). (අ) සරේ ය - විල්වල

(ආ) සරේ ය - නාදය

(X). (අ) හේරත් ගේ

(ආ) වැසිකිළියක් පිළිබඳව

02. (I). (අ) උපතින් / උත්පත්තියෙන්

කැලයේ / වනාන්තරයේ / අරණේ

(ආ) තමාගේ පියා නරයෙකු නොව වනයෙහි දී හමු වූ සිංහ රාජයෙකු බව මවගෙන් දැන ගැනීම.

The National e-learning Portal for The General Education

(II). (අ) ගැමියන්

* පැවරූ කාර්යය නිසි කළ ඉටු නොකිරීම
* වැසිකිළි භාවිතයට හුරුවීමට ඇති අකැමැත්ත

සෞඛ්‍ය පරීක්ෂක

* නිශ්චිත කාලය තුළ තම කාර්යය සොයා නොබැලීම
* තම රැකියාව ගැන පමණක් සිතා කටයුතු කිරීම

(ආ) * "එහෙමනම් අපට පෙරේතයො කොහොමට වත් පෙනෙන්නෙ නෑ නොවැ"

* " ඉතින් ඒ නොපෙනෙන සතා පෙනෙන දෙයක් කාපුවහම ඒ කාපු දේවත් පේන්ට එපා යැ"

(III). (අ) "ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ"

(ආ) " ඔබහට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන්"

(IV). (අ) උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය

(ආ) උත්ප්‍රේක්ෂාලංකාරය , අනුප්‍රාසය

(V). (අ) තෙල ලෙසින් - මේ අයුරින් / ඒ අයුරින්

සී පී සේක - සිනා සුණු සේක / සිනාසුණහ

03. (I).

* " සිත නොම සැන සේ හිඳිනට මෙලෙසේ
දිවි හිමියෙන් මෙලෙනේ
බොහො ආදර ඇති මුත් ම පියා අපහට
පල නැත මෙ දිවියෙනේ "

* " ........................
රාජකතා කී විසිතුරු
දැන් සිහිවන්නේ
සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ"

* " ............

කුමක්දෝ මේ පාපේ ලෙනෝ මේ විසීමේ සෙතක් දෝ

යන්ට දැන්නම් කාලෙ වේ

මැණියන් හා නැගනි සමගින්

උරුමෙ අපගේ සොයමිනා.....

* " මැණියනි කිව ඔබ බස් අසා

සනිටුහන් කර ගතිමි

නොපමාව යා යුතු ය

මේ ලෙනෙන් ඔබ දෙදෙන

මා සමග යා යුතු ය ...."

* " ඔබ දෙදෙන මා සමග

නො ආවොත් යන්ට වේ

ඔබ දමා මේ ලෙනෝ

මට උරුම වූ දිවිය

මා සොයා යා යුතුය

....................

සපල කර ගත නොහැකි

ජීවිතේ මේ ලෙසේ"

නොපෙනෙන කලටා සැරසෙනු කුමටා

මා දැන් වළකන්ටා....."

* පටහැනි වෙන්ටා නොව ඔහු අණටා

වෙන මහ ගැලවෙන්ටා

නොපෙනන කලටා සැරසෙනු කුමටා

මා දැන් වළකන්ටා"

(II).

* " මා පියා හැර දමා
යන්නෙ අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්ටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙස දෝ
නැද්ද වෙත පියාණන්
ආදරේ ඔබ හදේ
මෙවන් දේ කියන්ටා
සොහොයුරනි පෙම්බරා"

* " කෙසේ හෝ යා නොහැක
ඇතේ තර කර වසා
දොර ලෙනේ මහ ගලින
පියතුමගෙ රුදු තුමුල
බාහු යුවළින් ම මීස
බැරිය සොලවන්ට එය
යන්ට නොසිතන්ට මා
සොහොයුරනි පෙම්බරා"

**නැතහොත්**

(I). * දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය.
* නොයෙක් තැනම පිපි මල් පිරුණු පොකුණුය.
* නුදුරුව සිහිලැ 'ලී ගඟුලැ'ලී ය.
* පවන'ද පිපි තුරේ ය නිරතුරේ ය.

(II). * සාර පලය අඹ දඹ රඹ ද වල් පිට
* කුලින් කුළම සිහිලඹ වැහෙන කඳුරුය
* පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
* දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතු ය. ආදී කවි.

04. (I). * සියලුම රාජ්‍යයන්හි සිදුවන කටයුතු පිළිබඳ දැන ගෙන ඒම පිණිස ගිරා පෝතකයා යැවීම.

* රජ දරුවන් සියයක් හා තවත් බොහෝ පිරිස මැරීමට සූදානම් කර තිබූ මධු පාන උත්සවය විධ්වංසනය කිරීම.

* කේවට්ටයාගේ සියලු උපායන් ඉදිරියේ ඉතා පහසුවෙන් ඊට ප්‍රතිචාර දක්වමින් ඔහුගේ හැකියාවන්ට අභියෝග කිරීම.

(II). * තමාගේ පුද්ගලික අභිමතාර්ථ නැතහොත් ආත්මාර්ථ සාධනයෙහි ලා චූලනි බ්‍රහ්මදත්ත රජු මෙහෙයවීම.

* පටු අවශ්‍යතා වෙනුවෙන් රජදරුවන් හා තවත් පිරිස ඝාතනය කිරීමට සැලැස් වීම.

* එක් එක් උත්සාහයන් පරාජය වුවත් සෑමවිට ම තම පටු අරමුණු ජය ගැනීමට ප්‍රයන්ත දැරීම.

**නැතහොත්**

(I). * ප්‍රිය සාදය සඳහා ආරාධනා පත්‍රයක් ලබාගෙන එය තම බිරිඳට සතුටින් භාර දීම.

* තමා ඉතා අසීරුවෙන් ආරක්ෂා කර සිටි ප්‍රෑන්කු 400ක මුදල ඇඳුමක් සඳහා ලබාදීම.

* තම බිරිඳට උත්සවය අවස්ථාවේ ඕනෑ තරම් සතුටු වීමට අවස්ථාව ලබා දී තමා වෙන් ව සිටීම.

* ප්‍රීති සාදය නිම වූ පසු ඔහු ගෙන ආ බ්ලැන්කේට්ටුව ඇයට පැලඳ වීම.

* නැති වූ මාලය පිළිබඳ ව වචනයකින්වත් බිරිඳට චෝදනා නොකර නැවත එම මාලය සෙවීමට පයින්ම ගමන් කිරීම.

* නැවත වෙනත් මාලයක් සොයමින් විවිධ ස්ථානවලට යාම. (පැලේ , රෝයල් වීථියේ පිහිටි සාප්පු වෙත යාම.)

(II). * තමාට තරම් නොවූ විවාහයක් කරගත් බව සිතමින් අසතුටින් සිටීම.

* විශාල මාලිගා සිතින් මවා ගනිමින් , මනස්තාපයෙන් , පශ්චාත්තාපයෙන් කල් ගෙවීම.

* මහාර්ඝ තිරරෙදි ,උස් ලෝකඩ පහන් , ගිනි උඳුන් , සරුවාල ඇඳගත් සේවකයන් , අන්තර් ගර්භහාර ආදි සිතින් මවාගත් පහසුකම්.

* උත්සවයට සහභාගි වී තමා කරා ගලා ආ ආශ්චර්යවත් ආහ්ලාදයන් හා බහුමානයන්ගෙන් ද අතිමහත් සතුටට පත් වීම.

* තම රූප සෞන්දර්ය පිළිබඳ ආනන්දයෙන් සිටිම.

05. විවාහ ජීවිතය සඳහා .............

* එක්වුණදාට උක් දණ්ඩේ පැණි සේමා

* අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

* රන් විමනේ සිටිමුන් දුක නැති වෙද්ද

සාමාන්‍ය ජීවිතය සඳහා.............

*ගසට කෙටු ගස මුල පැයුමෙන් දැනේ

* නහින දෙහින කාලෙට පින් කෙරුම යුත

* වරද පෙනෙන තරමට වැරදුණා නොවේ

* ගොඩැල්ලෙ තරම දැනගෙන ළිඳ කපනු

* ඇස නැතිදා පොත ගත්තේ කියන්ට ද

06. * ආරම්භයේ දී ම කතෘ සාරය ඉදිරිපත් කිරීම.

* සංවාදාත්මකව කතාව ඉදිරිපත් කිරීම.

* සෑම චරිතයක් සඳහා ම ගෞරවාර්ථ නාම භාවිතා කිරීම.

උදා -: පුත ,විද්දතාණෝ , දුවනියන් , පුත්‍රයාණන්

* උපමා භාවිතය

- ''අවකාශයෙන් සැදූ හසුරුන ඇදි ඇදි සේ දුවන්නා සේ''

- ''පැසුණු ගොයම් මුල් වූවා සේ ..''

* අවශ්‍ය පරිදි ගාථාපාඨ යොදා ගැනීම.

උදා-: '' ඉඬස පස්ස නටපුත්ත උග්ගසේන මහබ්බල''

* ධර්මාවවාදයක් ලබා දීම.

''තුන්දුසිරිත් දුරුව තුන් සුසිර පුරා මතු මතුයෙහි ලැබිය යුතු ලොවි ලොවුතුරා ගුණ විශේෂයට පිහිට විය යුතුය.''

* ''මේ සිත තබා , අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරුවිය යුතු''

* කතාවත් බණත් එක්වර ම ඉදිරිපත් කිරීම.

* අවස්ථානුකූලව කෙටි වැකි යොදා ගැනීම.

උදා-: '' ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි''

උඩ අහස සක්මදුන් කෙරෙයි , නටයි , ගීත් කියයි.

07. '' කඳු බෑවුමක දං බෝවිටි පඳුරු තළා.............''

කුඩා දියපහරක් ලෙසින් ඇරඹෙන ගංගාව මෙන් ම ජීවිතයේ ද ආරම්භය සිදුවන අයුරු

* '' සැහවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි ''

ජීවිතයේ මුණ ගැසෙන විවිධ අවස්ථා ඒවාට ඍජුව මුහුණ දෙන ආකාරය ජීවිතයේ යෞවන කාලය මෙහි වර්ණයට හසුව ඇත.

* ''මී අඹ - කිරල -මාදම් ගෙඩි ළදරු වියෙ''

ජීවිතයේ විවිධ අවස්ථා පිළිබඳ ව පැවසේ. සොඳුරු රසවත් මෙන් ම කර්කශ අමිහිරි අවස්ථාවන් ද ජීවිතයේ හමු වන අයුරු දක්වයි.

* '' හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම''

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**SINHALA**

**සිංහල**

# QUESTION PAPER - III

# ප්‍රශ්න පත්‍රය - III



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍ය - III**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

**සැලකිය යුතුයි.**

* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **05**කට පමණක් උත්තර සපයන්න.
* 1 , 2 , 3 , 4 ප්‍රශ්නවලටත් 5 , 6 , 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
* මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. **(I)** සිට **(X)** දක්වා ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(I). " ............ එමඟට නොයා එමහැ අඟුල්මල් නම් සොරෙකැ , දරුණු , .............."

(අ) මෙය ශ්‍රවණය කළේ කවු ද?

(ආ) අමාවතුර ග්‍රන්ථයේ අන්තර්ගත පරිච්ඡේද ගණන කීය ද?

(II). ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු

බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු

...................................................................

...................................................................

(අ) මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත පද්‍යයට වඩාත් ගැළපෙන ආප්තෝපදේශය ලියා දක්වන්න.

(III). "රිසි නොවී ද මා පියාට වා සේ මාලිගේ ......"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?

(ආ) මෙම කොටස ඇතුළත් නාට්‍යයේ රචකයා පිදුම් ලැබූ සම්මාන දෙකක් ලියන්න.

(IV). " බල පිරිසෙන් සහ යාපා පටුන් ගෙන

බල සේනානායක සපු කුමරු එන"

ඉහත කවි දෙපදයෙහි ඉරි ඇඳි පද දෙකේ අර්ථ පිළිවෙළින් ලියන්න.

(V). " මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්සු ඔවුන් දැකැ **වෙවුලන්මැ යැ , පලත් මැයැ,** **දොර පියා ලත් මැ යැ** "

(අ) ඉහත කොටසේ තද කළු අකුරින් මුද්‍රිත කොටසින් මතුවන කාව්‍ය අලංකාරය කුමක් ද?

(ආ) මූඪගර්භ , පණිවා යන පදවල තේරුම් ලියන්න.

(VI). (අ) දණ්ඩීන්ගේ 'කාව්‍යාදර්ශ' කෘතිය අනුව ලියැවුණු අනුවාද සිංහල කෘතිය කුමක් ද?

(ආ) එහි කතුවරයා ලෙස පිළිගැනෙන්නේ කවු ද?

(VII). දෙවැට දිග කරඳවැල් ආරුක්කු යට සැඟව

නිල්කුරුලු බිලිඳු නිදි ඇහැරවන්නේ කුමට ?

...............................................................

...............................................................

(අ) ඉහත කවියේ ඉතිරි කවි දෙපදය ලියන්න.

(ආ) මෙහි ඇතුළත් උපමාව උපුටා දක්වන්න.

(VIII). " දේවයන් වහන්ස නොසිතා වදාළ මැනව , අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති ....."

(අ) "දේවයන් වහන්ස" යනු කවරක් ද?

(ආ) මෙහි සඳහන් "බලවත් උපාය" කුමක් ද?

(IX). පහත පද්‍ය කණ්ඩයේ ඉරි ඇඳි පදවල අර්ථ වෙන් වෙන් ව ලියන්න.

අවට සුපිපි <u>සරේ ය</u> බිඟු <u>සරේ ය</u>

සිත එවෙහෙර කෙරේය ලොබ කෙරේය

(අ) සරේය

(ආ) සරේය

(X). " එහෙම දෙයක් ගැන අහලවත් නැතුව ඇති මයෙ හිතේ"

(අ) කාගේ ප්‍රකාශයක් ද?

(ආ) "එහෙම දෙයක්" යනුවෙන් අදහස් වන්නේ කුමක් පිළිබඳව ද?

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(I). " සිංහයෙක් වේ මා පියා
<u>ජන්මයෙන්</u> ලත් මේ <u>අරන්නේ</u>
පුරුදු වූ වා සේ සදා
කුමරියක් වේ මාගෙ මවු
උත්තරීතර ජන්ම ලද්දී
උරුම වූ යස ඉසුරටා"

(අ) මෙහි ඉරි ඇඳි පදවල තේරුම් ලියන්න.

(ආ) මෙය ප්‍රකාශ කරන තැනැත්තා හෙළි කරගත් රහස කුමක් ද?

(II). " ....... වළෙන් පසු නැවතත් වැඩ නතර විය. ඒ මෙවරත් සෞඛ්‍ය පරීක්ෂක සති දෙකක් ඇතුළත නොපැමිණි බැවිනි. එහෙත් හය මසකට පමණ පසු යළිත් ඔහු ගෙදරට පාත් වූ කල ...."

(අ) මෙම ප්‍රකාශය අනුව ගැමියන් පිළිබඳ හා සෞඛ්‍ය පරීක්ෂක පිළිබඳ ව පෙනෙන දුර්වල ලක්ෂණයක් බැගින් ලියන්න.

(ආ) පාසලෙන් ලද අධ්‍යාපනයෙන් කථකයා තර්කානුකූල කෙනෙකු බවට පත් වූ බව හැඟෙන ප්‍රකාශයක් උපුටා දක්වන්න.

(III). " දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
......................................................................
......................................................................"

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) පැදිපෙළේ පැවසෙන පරිදි මෙහි සඳහන් පියාගේ උතුම් ප්‍රාර්ථනාව ප්‍රකාශිත පද්‍ය පාද දෙක ලියන්න.

(Iv). සැහවෙමි - එබෙමි - නිසසල වෙමි සසල වෙමි
ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි නොනවතිමි
කවදා කොතැන දී හෝ මහ මුහුද හිමි
හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි

(අ) මෙම පද්‍ය පන්තිය රචනා කළ දෘෂ්ටිකෝණය කුමක් ද?

(ආ) මෙම පද්‍ය පන්තියේ කතුවරයා භාවිත කළ කාව්‍ය උපක්‍රම 02ක් ලියන්න.

(v). ''....... එ හෙයින් දිවසින් බලනුවෝ ප්‍රාර්ථනාව <u>තෙල ලෙසින්</u> ම සමෘද්ධ වන නියාම දැන සිනා පහළ කළහ. දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණාවක් විචාරා නො පියා සමණන්ට ' මුන් වහන්සේ සිනාවක් <u>සී පී සේක</u> .විද්දත් කමෙක් ඇති වනැ' යි''

(අ) ඉහත කොටසේ ඉරි ඇඳි පදවල අර්ථ ලියා දක්වන්න.

(ආ) ඉහත සම්පූර්ණ උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

03. (I). තරුණයෙකුගේ සිතුම් පැතුම් හා ක්‍රියා කලාපය පිළිබඳවත්

(II). පියා කෙරෙහි අසීමිත ආදරයක් දක්වන දියණියක පිළිබඳවත්, සිංහබාහු නාට්‍යයෙන් නිරූණය වේ.

එක් කොටසකට උදාහරණ අවස්ථා 02 බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

හංස සංදේශ කතුවරයා ,

(I). චමත්කාරජනක ගම්පියසක් පිළිබඳ ව හා

(II). ආර්ථික වශයෙන් සමෘද්ධිමත් ගම්පියසක් පිළිබඳ තොරතුරු දක්වයි.

එක් කොටසකට උදාහරණ 02 බැගින් දක්වමින් මේ බව විමසන්න.

04. උම්මග්ග ජාතකයේ එන,

(I). මහෞෂධ පඬිතුමා තම බුද්ධිය සත්ත්වයාගේ යහපතටත් ,

(II). කේවට්ට බමුණා තම බුද්ධිය බොහෝ දෙනාගේ විනාශයටත් යොදාගත් අයුරු

එක් කොටසකට උදාහරණ අවස්ථා 02 බැගින් දක්වමින් මේ පිළිබඳ පැහැදිලි කරන්න.

**නැතහොත්**

දියමන්ති මාලය කෙටි කතාවේ,

(I). ලොයිසල් මහතා තම බිරිඳට අසීමිතව ආදරයකින් යුතු ස්වාමියෙකි.

(II). මැටිල්ඩා ලොයිසල් සිහින ලොවක ජීවත්වන අයෙකි.

එක් එක් චරිතය සඳහා උදාහරණ 02 බැගින් දක්වමින් මේ පිළිබඳ ව පැහැදිලි කරන්න.

- **5 ,6 , 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

05. විවාහ ජීවිතයටත් , සාමාන්‍ය ජීවිතයටත් ජන කවියා උපදෙස් ලබා දුන් අයුරු “ හානා හීය පානා අඬහැරෙන් දැනේ” පද්‍ය පන්තියෙන් උදාහරණ අවස්ථා 03ක් ඇසුරින් පැහැදිලි කරන්න.

06. සද්ධර්මරත්නාවලි කතුවරයාගේ කතාකලාවේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ ව “ උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව” පාඩමෙන් උදාහරණ අවස්ථා 03ක් දක්වමින් විමසන්න.

07. අජීවී වස්තුවකට සජීවී බව එක් කරමින් ගැඹුරු ජීවන දර්ශනයක් ද පෙන්වීමට එච්.එම්. කුඩලිගම කවියා සමත් වූ අයුරු “ගංගාවේ සංගීතය” පැදිපෙළෙන් උදාහරණ අවස්ථා 03ක් මගින් පැහැදිලි කරන්න.

The National e-learning Portal for The General Education

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**SINHALA**

**සිංහල**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍ය - II**

**අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

**සැලකිය යුතුයි.**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 80 කි.

1. **(I)** සිට **(X)** දක්වා ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(I) ( අ) සිංහල වර්ණ මාලාවේ ඇති ඕෂ්ඨජ අක්ෂර 02ක් ලියා දක්වන්න.

(ආ) තාලුජ අක්ෂර 02ක් ලියා දක්වන්න.

(II) පහත සඳහන් වාක්‍යයෙහි වැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන 02ක් ඇත. එම වචන 02 පමණක් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ලියා දක්වන්න.

"ප්‍රාසාංගික වේදිකාවේ ඉදිරිපත් කෙරෙන ශෝකාලාපයක් බඳු ගීත පිළිබඳ ඇත්තේ බලවත් කණගාටුවකි."

(III) (අ) කාලාර්ථයේ නිපාත පද 02ක් ලියන්න.

(ආ) ඔහු විසම ගති ඇත්තෙකි , යන්න මට පිළිගන්නට බැරි ය. මෙම වාක්‍යයෙහි ඇති උපසර්ග 02ක් උපුටා ලියන්න.

(IV) පොඩි තුඩු දොඩම් කටු මෙනි ගී විදිල්ලෙකි
නෙත් අබ වගෙයි පා පොල් කෙඳි තොටිල්ලකි

මෙම පද්‍ය පාඨයන්හි ඇති උපමාවක් හා රූපකයක් උපුටා ලියන්න.

(V) පහත දැක්වෙන පද කුමන සමාසයකට අයත් දැයි නම් කරන්න.

(අ) ගොවිණිය

(ආ) පංචශීලය

(VI) දිගාමඩුලු ප්‍රදේශයේ බස්වහරට අනුව

(අ) හොටි අම්මා

(ආ) බෝල්ලු යන පදවල තේරුම ලියන්න.

(VII) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිවැරදි කර දක්වන්න.

(අ) ගුරුවරු පාසලට පැමිණ ඇත.

(ආ) මා විසින් මිතුරන් පසසන ලදහ.

(VIII) අම්මා <u>දුරකථනයෙන්</u> <u>මල්ලීට</u> අවවාද දුන්නා ය.

ඉරි ඇඳි පද කුමන විභක්තියට අයත් දැයි නම් කරන්න.

(IX) එකිනෙක පද අනුරූප වන සේ පහත දැක්වෙන පද යුගල සකසන්න.

(අ) බුදු රශ්මිය

(ආ) සරු භූමියක්

(X) පහත සඳහන් පදවල තේරුම ලියන්න.

(අ) කැටතෙල

(ආ) කදෝපැණියන්

( ලකුණු 2 X 10 = 20 යි)

The National e-learning Portal for The General Education

02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250ට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

* අන්තර්ගත විය යුතු කරුණු
* ඡේද සංඛ්‍යාව
* කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
* යොදා ගත හැකි මාතෘකාව ආදිය පිළිබඳ මඟ පෙන්වීමක් අදාළ විස්තර ඇසුරින් ලබා ගන්න.

(අ) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට හුදකලාවේ සිටිය නොහැකි ය. ලෝකයේ දියුණුව නවීන තාක්ෂණය මත රඳා පවතිද්දී එකී නවීන තාක්ෂණය වෙත අප ද යොමු විය යුතු ය. තාක්ෂණයේ දියුණුව සමඟ සියලු කාර්යයන් පහසු වී ඇති අතර එය යහපතට මෙන් ම අයහපතට ද හේතු වී ඇති බව බොහෝ විට දැනෙන කරුණකි. එබැවින් නවීන තාක්ෂණය නිවැරදි භාවිතයට සැමගේ අවධානය යොමු විය යුතු ය.

(ආ) අපචාර, අපයෝජනය, සොරකම් හා මිනීමැරුම් පිළිබඳ අනේකවිධ සිදුවීම් මාධ්‍ය හරහා දිනෙන් දින වාර්තා වේ. මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය මේ සියලු සිදුවීම් පසුපස ඇති අදෘශ්‍යමාන බලවේගයක් ලෙස ක්‍රියාකරන බව බොහෝ සිදුවීම් නිරීක්ෂණය කළ පසු කිව හැකි ය. එබැවින් රටක තිරසාර යහගුණ පිරි පැවැත්මක් උදෙසා මතින් තොර රටක් බිහි කිරීමට කටයුතු කළ යුතු ය.

(ඉ) නිමාවක් නැති වෙහෙසකර තරගකාරි අධ්‍යාපන ක්‍රමයකට අනුගතව සිටින අවස්ථාවක දී බහුතරයක් පාසල් සිසු දරු දැරියන්ගේ ජීවිතයෙන් සාහිත්‍යය බොහෝ ඈතට ගොස් ඇත. සාහිත්‍ය පොතපත කියවීමට විශේෂයෙන් පාසල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ පවා එතරම් හොඳ ආකල්පයක් නැත. කුඩා කාලයේ සිට දරුවන් සාහිත්‍ය පොතපතට නැඹුරු කිරීම තුළ ඔවුන්ගේ රසඥතාවත්, පරිකල්පන ශක්තියත් වඩවාලීමේ වුවමනාවක් දෙමව්පියන් තුළ ද නොමැත්තා සේ ය. මෙම කනගාටුදායක තත්ත්වය මත අප රටේ ජන ජීවනය කෙරෙන් සාහිත්‍ය යන වචනය පවා අතුරුදහන් වන්නට වැඩි දවසක් ගත නොවනු ඇත.

(ඊ) ක්‍රීඩාව කවදා කෙසේ බිහි වී ද යන්න නිශ්චිතව කිව නොහැකි ය. එය මානවයා ශිෂ්ටාචාර ගත වීමට පෙර සිට ම පැවත ආ බව විද්වත් මතය යි. ක්‍රීඩාව මගින් උද්වේගකර සතුටක් ලද හැකි ය. එසේ ම ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ ද රැසකි. සමස්තයක් ලෙස ගත් විට කුමන ක්‍රීඩාවකින් වුව ද ලබා ගන්නා පුහුණුව මානසික හා කායික සුවය සඳහා ඍජු ලෙස දායක වෙයි.

(ලකුණු 25යි)

3. පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශය කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශයේ අග ලියන්න.

සරල සමාජවල සංස්කෘතිය පවරා දීමේ කාර්යයට වැඩි ප්‍රමුඛත්වයක් දරනු ලැබුවේ පවුල විසිනි. නමුත් වර්තමාන සංකීර්ණ සමාජවල ඒ සඳහා වැඩි ම අවධානයක් පාසල වෙත යොමු වී ඇත. පවුල තුළින් සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් තව දුරටත් ලැබුණත් පාසල මඟින් භාෂාව උපයෝගී කරගනිමින් සංස්කෘතිය පැතිරවීමට කටයුතු කෙරේ. පාසලක් තුළ දී සමාජ ඉගෙනීම ශාස්ත්‍රීය විෂයමාලාව තුළින් මෙන් ම සදාචාර විෂය මාලාව තුළින් ද ලබා දෙයි. ජීවත්වන සමාජයෙන් ඔබ්බට ගොස් ජාතික හා විශ්ව සංස්කෘතිය පවරා දීමේ පුළුල් කාර්යය ද පාසල වෙතට ලැබී ඇත.

පාසල් සංස්කෘතිය ශාස්ත්‍රීය සංස්කෘතියක් ලෙස පිළිගැනේ. එරික්සන් විසින් පාසල් සංස්කෘතිය පිළිබඳ සිදු කර ඇති විග්‍රහය ඇසුරින් පෙනී යන්නේ එය ශාස්ත්‍රීය අරමුණු ක්‍රමවත් ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සම්ප්‍රදාය ඇසුරින් ගොඩනගා ගත් අධ්‍යාපන ක්‍රියාවලියක් බවයි. පාසලක යහපත් සංස්කෘතියක් ගොඩ නගා ගැනීම පාසලේ කාර්ය සංවිධානය සතු ශක්තියක් වේ. නෛතික බැඳීම්වලින් තොරව පාසල් සංස්කෘතියක් ගොඩනගා ගන්නෙ නම් එතැන ඉතා හිතකර ඉගෙනුම් පරිසරයක් ද නිර්මාණය වේ. ඕවන්ස් හා ස්ටෙන්හෝප් පාසල් සංස්කෘතිය පිළිබඳ ව විශ්වවිද්‍යාල සිසුන් ඇසුරින් කළ අධ්‍යයනයේ දී ළමයාට පාසල බෙහෙවින් හුරුපුරුදු තැනක් බව හඳුනා ගැණිනි. එය පවුල, නිවස, කණ්ඩායම හෝ උත්පත්ති ස්ථානය ලෙස හඳුන්වා ඇත. විදුහල්පති, දෙමාපියන්, පෝෂණය කරන්නෙක්, මිත්‍රයෙක්, මඟ පෙන්වන්නෙක් ලෙස හඳුන්වයි. මෙබඳු වාතාවරණයක් තිබීම දරුවාගේ අධ්‍යාපනයේ සාර්ථකත්වයට හේතුවන බව පැහැදිලි කරුණකි. සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පාසල් සංස්කෘතිය අදෘශ්‍යමාන ලෙස බලපානු ඇත.

4. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ශිෂ්‍යයා පිළිබඳ අවබෝධය ගුරුවරයාට ඉතා වැදගත් බව " ජෝන්ස් ඇඩම්ස්" අධ්‍යාපනඥයා පෙන්වා දී ඇත. ඒ අනුව උගන්වනු ලබන විෂය හා ඉගෙන ගනු ලබන ළමයා යන විචල්‍ය දෙක කෙරෙහි ගුරුවරයාගේ අවධානය යොමු විය යුතු ය. මින් වඩාත් වැදගත් වනුයේ ළමයා පිළිබඳ දැනගැනීම යි. ළමයින්ගේ හැකියාවන් විවිධ ය. ළමයින්ගේ ප්‍රබලතා මෙන් ම දුබලතා ද ගුරුවරයා දැන සිටිය යුතු ය. සාමාන්‍ය ළමයින් මෙන් ම ගැටලු සහිත ළමයින් ද සිටිති. උදාසීන බව, චර්යාමය ගැටලු, මතක තබා ගැනීමේ අපහසුතා, තේරුම් ගැනීමේ අපහසුතා, ඉන්ද්‍රිය ආබාධ, චිත්තවේග ගැටලු ආදී නොයෙක් ගැටලු සහිත ළමයි සිටිති ඔවුන් කෙරෙහි මැදිහත්ව උපේක්ෂාවෙන්, ඉවසීමෙන්, උනන්දුවෙන් ඔවුන් තුළ ද යම් ඉගෙනීමක් ඇති කරලීමේ ශක්‍යතාවක් ගුරුවරයාට තිබිය යුතු ය. ඔවුන්ගේ ගැටලුවේ ස්වභාවය එයට යෙදිය හැකි ප්‍රතිකර්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා ළමයින්ගේ බුද්ධි මට්ටම් හා ශාක්‍යතා නිවැරදිව තේරුම් ගතහොත් ඉගැන්වීමේ කාර්යය සාර්ථක කර ගැනීමට මහගු පිටුබලයක් වනු ඇත.

(I). ශිෂ්‍යයා පිළිබඳ අවබෝධය ගුරුවරයාට ඉතා වැදගත් බව පෙන්වා දුන්නේ කවුද ?

(II). මෙහි සඳහන් වන ගුරුවරයාගේ අවධානය යොමු විය යුතු විචල්‍ය දෙකක් නම් කරන්න.

(III). ළමයින්ට ඇති ගැටලු කිහිපයක් මෙහි සඳහන් වේ. ඉන් 2ක් නම් කරන්න.

(IV). ගැටලු සහිත ළමයින්ට ඉගැන්වීමේදී ඉගැන්වීම් කාර්යය සාර්ථක කර ගැනීමට ගුරුවරයා සතුවිය යුතු ගුණාංග 02 ක් නම් කරන්න.

(V). පහත සඳහන් පදවල තේරුම ලියන්න.

(අ) . ශක්‍යතාව

(ආ) . උදාසීන

(ලකුණු 2 X 5 = 10 )

05. ස්වයං රැකියාවක් ආරම්භ කිරීමේ බලාපොරොත්තුවෙන් ඔබ විසින් පසුගිය මාසයේ දී ABC ආයතනයෙන් මිල දී ගත් මහන මැෂිමේ කාර්මික දෝෂයක් නිසා මේ වන විට අක්‍රිය තත්ත්වයේ ඇත. එනිසා එය යථා තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා සහය ඉල්ලා සිටිමින් ABC ආයතනයේ කළමනාකරු වෙත යවන ලිපිය ලියන්න.

(වචන 100ක් පමණ සෑහේ)

**නැතහොත්**

පසුගිය දිනෙක පො/අත්තරගල්ලෑව මහ විදුහලේ දී පැවැත් වූ නිවාසාන්තර ක්‍රීඩා උළෙල වාර්තා කිරීමට ගිය පුවත්පත් වාර්තාකරුවන් අතර චන්දන අක්කරවත්තල එක් අයෙකි. ගරු ක්‍රීඩා අමාත්‍යතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ මෙහි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රමුඛ රාජ්‍ය නිලධාරීන් රැසක් ද ආදි ශිෂ්‍ය, දෙමාපිය, ප්‍රභූ සහ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද වූහ.

ක්‍රීඩා තරගවලින් අනතුරුව පැවති ත්‍යාග ප්‍රදානෝත්සවය අවසානයේ සිය අදහස් දැක් වූ ඇමතිවරයා ප්‍රකාශ කළේ තම සිසු දිවිය අද දින යළිත් සිහිපත් වූ බවත්, ජීවිතය සාර්ථක කර ගැනීමට ක්‍රීඩා පිටිය තුළින් ලද අත්දැකීම් බෙහෙවින් ඉවහල් වූ ආකාරයත් ය.

රම්‍ය, සුරම්‍ය, සුභ නිවාස තුනෙන් සුභ නිවාසය සමස්ත ශූරතාව දිනා ගත් අතර පිළිවෙළින් රම්‍ය, සුරම්‍ය දෙවන හා තුන්වන ස්ථාන දිනා ගත්තේ ය. ඒ ඒ වයස් කාණ්ඩයන් ශූරතා ප්‍රදානයෙන් පසුව අවසානයේ පැවති සරඹ සන්දර්ශනය කාගේත් සිත් ඇදගත් අංගයක් විය.

චන්දන අක්කරපත්තු ඔබ යැයි සිතා අත්තරගල්ලෑව මහ විදුහලේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල පිළිබඳ පුවත්පත් වාර්තාවක් පිළියෙල කරන්න.

(වචන 100ක් පමණ සෑහේ)

(ලකුණු 15 යි)